

# සුනාමියෙන් හානිවූ දික්වැල්ලේ ව්‍යාපාරිකයන්ට ආධාර

මුහුද ගොඩගැලීමෙන් සිදුවූ හානිය නිසා ව්‍යාපාර කටයුතු නතර කිරීමට සිදුවූ මාතර දික්වැල්ල පොදු වෙළෙඳ පොළේ ව්‍යාපාරිකයන්ට සිය ව්‍යාපාර යළි ආරම්භ කිරීමට අත දෙමින් කොළඹ මධ්‍යම රොටරි සමාජයේ හා කොළඹ දිස්ත්‍රික් එජාප මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාගේ අනුග්‍රහයෙන් මූල්‍ය ආධාර හා උපකරණ සපයන ලදී.

මෙම ආධාර උපයෝගි කරගනිමින් එහි ව්‍යාපාරිකයන් සිය ව්‍යාපාර කටයුතු යළි ආරම්භ කර ඇති අතර ඒ පිළිබඳව සොයා බැලීමට මිලින්ද මොරගොඩ මහතා පසුගියදා මාතර දික්වැල්ලේ පොදු වෙළෙඳ පොළට ගිය අවස්ථාව මෙහි දැක්වේ.

මාතර දිස්ත්‍රික් මන්ත්‍රී ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතාද මේ අවස්ථාවට එක්විය.